*සැ. යු.*- 2022.07.08 දින පළ වූ අංක 2,288 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,289 - 2022 ජූලි මස 15 වැනි සිකුරාදා - 2022.07.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 554 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2022 ජූනි මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 අගෝස්තු මස 05 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජූලි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

553 - B 082363 — 353 (2022/07)
D 1 -

# පිස්කල් විකිණීම්

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - හලාවත මගින්

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

වර්ෂ 2021ක් වූ සැප්තැම්බර් මස 14 වැනි දිනැති කොළඹ දිසා අධිකරණයේ අතිරේක දිසා විනිසුරුතුමියගේ නියෝගය පරිදි මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව,

(1) වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්නේස්වරම් පත්තුවේ, පිටිගල් කෝරළේ උතුර හලාවත ලියාපදිංචි කොට්ඨාසය තුළ මයික්කුලම පිහිටි පොන්නවරන්පිටිය පන්කරම්තොට්ටම් අනකිදංගු ඉදිපිටියවත්ත සහ අළඹවත්ත සහ දැනට ක්‍රිස්ටිතොට්ටම් නමැති ඉඩමට වී. පෙරේරා මිනින්දෝරු තැන විසින් වර්ෂ 1955 මාර්තු මස 16 වැනි දින මැන සකසන ලද අංක 833 දරන පිඹුරේ ඉඩමට මායිම්, උතුරට : රෝහල ද, නැගෙනහිරට : හලාවත සිට කොළඹ දක්වා දිවෙන මහ පාර ද, දකුණට : ටී. ඒ. ඩග්ලස් පෙරේරාට අයිති මෙම ඉඩමේ බෙදා වෙන්කළ කොටස සහ බස්නාහිරට : වී. පෙරේරා මිනින්දෝරු තැන විසින් වර්ෂ 1956 ජූලි මස 18 වැනි දින මැන සකසන ලද අංක 1004 දරන පිඹුරෙන් බෙද වෙන්කළ මෙම ඉඩමේම කොටස යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (පර්. 20.0) ක් විශාල බිම් කැබැල්ල එහි පිහිටි ගොඩනැගිලි සහ සෑම සියලු දේත් වේ.

(2) වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්නේස්වරම් පත්තුවේ, පිටිගල් කෝරළේ, හලාවත ලියාපදිංචි කොට්ඨාසය තුළ මයික්කුලම පිහිටි පොන්නවරම්පිටිය පන්කරම්තොට්ටම් අනකිදංගු ඉදිපිටියවත්ත සහ අළඹවත්ත සහ දැනට ක්‍රිස්ටිතොට්ටම් නමැති ඉඩමට වී. පෙරේරා මිනින්දෝරු තැන විසින් වර්ෂ 1956 ජූලි මස 18 වැනි දින මැන සකසන ලද අංක 1004 දරන පිඹුරේ ඉඩමට මායිම්, උතුරට : රෝහල ද, නැගෙනහිරට : වී. පෙරේරා මිනින්දෝරු තැන විසින් වර්ෂ 1955 මාර්තු මස 16 වැනි දින මැන සකසන ලද අංක 833 දරන පිඹුරේ ඉඩම, දකුණට : ටී. ඒ. ඩග්ලස් පෙරේරාට අයිති මෙම ඉඩමේම කොටස සහ බස්නාහිරට : පරිමලම්ගේ මෙම ඉඩමේම ඉතිරි කොටස යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20.0) ක් විශාල බිම් කැබැල්ල එහි පිහිටි ගොඩනැගිලි සහ සෑම සියලු දේත් වේ.

**වර්ෂ 2022ක් වූ අගෝස්තු මස 18 වැනි දින පෙ. ව. 10.00ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.**

විකිණීම පිළිබඳ දැන්වීම් සඳහා 2022.07.15 වැනි දින දිණමිණ, තිනකරන් සහ ඩේලි නිවුස් පුවත්පත් ද, 2022.07.15 දින රජයේ *ගැසට්* පත්‍රයද බලන්න.

*ඉඩමට පිවිසීම*.- කොළඹ හලාවත ප්‍රධාන පාරේ හලාවත ආනන්ද විද්‍යාලය ඉදිරිපිට සහ හලාවත රෝහලට යාබද ඉඩම.

*ගෙවීමේ ක්‍රමය*.- ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%) දේපළ මිලදී ගත් වහාම ගෙවිය යුතු අතර, ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

වෙන්දේසිකරුගේ කොමිස් මුදල්, අයබදු සහ වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම් සහ වෙනත් වියදම් වෙන්දේසිකරු වෙත ගැණුම්කරු විසින් මුදලින් ගෙවිය යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

ජේ. එම්. වර්ණකුලසූරියර්,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාමවිනිසුරු,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
හලාවත.

07-123

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.